# කොවිඩ්-19 වසංගතය මැඩලීමේ ශ්‍රී ලාංකීය ක්‍රමවේදය

<u>කොවිඩ්-19 වසංගතය මැඩලීමේ ශ්‍රී ලාංකීය ක්‍රමවේදය</u>

<u>විධායක සාරංශය</u>

1. කොරෝනා වෛරස් වසංගතය (කොවිඩ්-19) ලොව පැතිරෙමින් පවතින අතර ශ්‍රී ලංකාව ද එහි ගොදුරක් බවට පත්ව ඇත. 2020 මැයි 8 දින වන විට රටවල් සහ ප්‍රදේශ 200කින් ආසාදිතයින් 3,918,600ක් පමණ වාර්තා වී ඇති අතර 270,700ක් පමණ දෙනා ඉන් මිය ගොස් ඇත.

2. මෙම වසංගත තත්ත්වයට මුහුණ දීමේදී ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපතිතුමාගේ දැක්ම වන්නේ "**ශ්‍රී ලංකාව තුළ කොවිඩ්-19 ව්‍යාප්තිය වැළැක්වීම සඳහා ක්‍රියාකාරී මැදිහත්වීම - PROACTIVE INTERVENTION TO PREVENT ANY OUTBREAK OF COVID-19 WITHIN SRI LANKA**" යන්නයි. ශ්‍රී ලංකා රජය විසින් ගන්නා ලද සියළු ක්‍රියාමාර්ග මෙම දැක්ම පෙරදැරිව සිදුකරන ලදී.

3. කොවිඩ්-19 වෛරසයේ කේන්ද්‍රස්ථානය චීනයේ සිට බටහිර දෙසට මාරුවීමත් සමග ශ්‍රී ලංකා රජය විසින් බොහෝ පූර්ව ක්‍රියාමාර්ග ගන්නා ලදී. මෙම ක්‍රියා ශ්‍රී ලංකාව තුළට ආගමන වැළැක්වීමේ සිට වෛද්‍ය හා සෞඛ්‍ය සේවා ක්ෂේත්‍රයන් සූදානම් කිරීම දක්වා විහිදේ. එහිදී රාජ්‍ය බුද්ධි සේවාව, වෛද්‍ය ක්ෂේත්‍රය, ආරක්ෂක හමුදා සහ ශ්‍රී ලංකා පොලිසිය ඕනෑම හදිසි සෞඛ්‍ය තත්ත්වයකට මුහුණ දීමට සූදානම් කර තබන ලදී. තවද රජය විසින් කොවිඩ්-19 ආශ්‍රිත සැලසුම් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් "**කොවිඩ්-19 ව්‍යාප්තිය වැළැක්වීමේ ජාතික මෙහෙයුම් මධ්‍යස්ථානය**" ස්ථාපිත කරන ලදී.

4. කොවිඩ්-19 වෛරසය ව්‍යාප්තියට එරෙහිව සටන් කිරීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් ගන්නා ලද උපාය මාර්ගය සමස්ත රාජ්‍ය අංශයේ සාමූහික ප්‍රවේශයක් ලෙස දැක්විය හැක. එය අතිගරු ජනාධිපතිතුමාගේ දැක්ම අරමුණු කරගනිමින් සියළු මට්ටම් දක්වා විහිදුනු අඛන්ඩ ක්‍රියාකාරකම් සමූහයක් වන අතර එය පහත මෙහෙයුම් ස්ථරයන් මූලික කොට ගෙන ඇත:

අ. <u>**සන්නද්ධ හමුදා / පොලිස් / බුද්ධි අංශ මෙහෙයුම් ස්ථරය**</u>. මෙය ශ්‍රී ලංකාව තුළට වෛරසය පැමිණීම වැළැක්වීම හා දැනටමත් වෛරසය රට තුළ සක්‍රිය නම් එය තවදුරටත් පැතිරීම වැළැක්වීම අරමුණු කොට ක්‍රියාත්මක වේ. හඳුනාගැනීම (Detection), හුදකලා කිරීම (Isolation) සහ සම්බන්ධිතයන් සොයාගැනීම (Tracing) මෙහි මූලික සිද්ධාන්ත වේ.

ආ. <u>**වෛද්‍ය සහ සෞඛ්‍ය ආරක්ෂණ මෙහෙයුම් ස්ථරය**</u>. මෙමගින් මූලිකව මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් හරහා වෛරස් ආසාදිතයින්ව හා ඔවුන් සම්බන්ධතා පැවැත්වූවන් කල්තියා හඳුනා ගැනීම, හුදකලා කිරීම සහ රෝහල් මගින් ප්‍රතිකාර ලබාදීම සිදුකරනු ලබයි. නොකඩවා PCR පරීක්ෂණ කිරීම, සෞඛ්‍ය ආවේක්ෂණය සහ නිරන්තර අධීක්ෂණය මෙහි මූලික අංග වේ.

ඇ. <u>**මනෝවිද්‍යාත්මක මෙහෙයුම් ස්ථරය**</u>. මෙම මෙහෙයුම් ස්ථරය මගින් කොවිඩ්-19 වෛරසය පිළිබඳව නිවැරදි තොරතුරු සැපයීම, ජනතාව දිරිමත් කිරීම සහ ජාතික සහයෝගීතාවය තහවුරු කිරීම අරමුණු කෙරේ. මෙහි මූලික හරය "**පළමුව ජීවිතය**" යන්නයි.

ඈ. <u>**ආර්ථික හා සමාජීය යහ පැවැත්ම උදෙසා වන මෙහෙයුම් ස්ථරය**</u>. රටේ අනාගතය කෙරෙහි අවධානය යොමුකරමින් ආර්ථිකය පවත්වා ගැනීම සහ ජනතාවට අඛණ්ඩව ආහාර

හා ඖෂධ සැපයුම් ලබාදීමෙන් ඔවුන්ගේ ජීවන තත්ත්වය පවත්වාගෙන යාම පිළිබඳව මෙම ස්ථරය අවධානය යොමු කරයි.

5. සියළුම මෙහෙයුම් ස්ථරයන් අතර සමමුහුර්තකරණය මෙන්ම රේඛීය අමාත්‍යාංශයන්, ත්‍රිවිධ හමුදාව සහ පොලිසිය, දෙපාර්තමේන්තු, අධිකාරීන්, සංස්ථා බලධාරීන්, පළාත් පාලන පද්ධති, සියලුම රාජ්‍ය හා පෞද්ගලික අංශවල හවුල්කරුවන් අතර මනා සම්බන්ධීකරණය හා සහයෝගිතාවය ශ්‍රී ලාංකීය ක්‍රමවේදයේ සාර්ථකත්වයේ පදනම වේ.

6. ශ්‍රී ලංකා රජය විසින් කොවිඩ්-19 පැතිරීම පාලනය සඳහා අනුගමනය කරන ක්‍රියාවලිය "**තෝමස් පුයෝගේ**" (Tomas Pueyo) "**මිටිය සහ නර්තනය**" (Hammer and Dance) න්‍යායට සමාන වේ. මෙහිදී ආක්‍රමණශීලී වූද ක්‍රියාකාරී වූද විවිධ පියවර (Hammer) අනුගමනය කරමින් වෛරසය පාලනය කළ හැකි රිද්මයකට තල්ලු කරනු ලබයි (Dance).

7. කොවිඩ්-19 වසංගතය ලොවපුරා පැතිරීම අඛණ්ඩව සිදුවන අතර විවිධ රටවල් වෛරසය පැතිරීම වැළැක්වීම සඳහා විවිධ ක්‍රම සහ විධි භාවිතා කර ඇත. කොවිඩ්-19 ව්‍යාප්තිය තුරන් කිරීමේ ශ්‍රී ලාංකීය ක්‍රමවේදය සක්‍රීය, ආක්‍රමණශීලී සහ නොකඩවා ඉදිරියට යන ක්‍රියාදාමයක් වන අතර ලෝකයේ බොහෝ රටවල් හා සැසඳීමේදී මෙම ක්‍රමවේදය ශ්‍රී ලංකාවටම ආවේණිකවූ ප්‍රශස්ත ආකෘතියක් බව පෙනීයයි.

## <u>කොවිඩ්-19 වසංගතය මැඩලීමේ ශ්‍රී ලාංකීය ක්‍රමවේදය</u>

### <u>හැඳින්වීම</u>

1. කොරෝනා වෛරස් වසංගතය (කොවිඩ්-19) ලොව පැතිරෙමින් පවතින අතර ශ්‍රී ලංකාව ද එහි ගොදුරක් බවට පත්ව ඇත. කොවිඩ්-19 වෛරසය 2019 වසරේ දෙසැම්බර් මාසයේදී චීනයේ වුහාන් ප්‍රාන්තයෙන් ප්‍රථමයෙන් වාර්ථා වූ අතර එය මේ වනවිට ලෝකයේ රටවල් බහුතරයක ව්‍යාප්තව ඇත. ශ්‍රී ලංකාව තුළ පළමු කොවිඩ්-19 ආසාදිත රෝගියා 2020 ජනවාරි 27 දින වාර්තා වූ අතර 2020 මාර්තු 11 දින දෙවන රෝගියා වාර්තා වීමත් සමග ශ්‍රී ලංකාව තුළද කොවිඩ්-19 රෝගය සක්‍රියව ඇති බව නිරීක්ෂණය විය. ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් 2020 ජනවාරි 30 දින වනවිට මෙම තත්ත්වය හදිසි මහජන සෞඛ්‍ය තත්ත්වයක් ලෙසද 2020 මාර්තු 11 දින වනවිට එය ලෝක වසංගත තත්ත්වයක් ලෙසද ප්‍රකාශයට පත් කරන ලදී. 2020 මැයි 8 දින වන විට රටවල් සහ ප්‍රදේශ 200කින් ආසාදිතයින් 3,918,600ක් පමණ වාර්තා වී ඇති අතර 270,700ක් පමණ දෙනා ඉන් මිය ගොස් ඇත.

### <u>කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ ශ්‍රී ලංකාවේ සූදානම</u>

2. මෙම වසංගත තත්ත්වයට මුහුණ දීමේදී ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපතිතුමාගේ දැක්ම වන්නේ "**ශ්‍රී ලංකාව තුළ කොවිඩ්-19 ව්‍යාප්තිය වැළැක්වීම සඳහා ක්‍රියාකාරී මැදිහත්වීම - PROACTIVE INTERVENTION TO PREVENT ANY OUTBREAK OF COVID-19 WITHIN SRI LANKA**" යන්නයි. ශ්‍රී ලංකා රජයේ සූදානම හා රජය විසින් ගන්නා ලද සියළු ක්‍රියාමාර්ග මෙම දැක්ම පෙරදැරිව සිදුකරන ලදී. ශ්‍රී ලංකාව පිහිටි භූ කලාපය තුළ මෙම වෛරසය ව්‍යාප්ත වීමටද ප්‍රථමව ශ්‍රී ලංකා රජය විසින් මේ සඳහා අවශ්‍ය නිසි ක්‍රියාමාර්ගයන් ගන්නා ලදී. ඒ අනුව ශ්‍රී ලංකාවේදී හමුවූ කොවිඩ්-19 ප්‍රථම ආසාදිතයා වන සංචාරයක් සඳහා ශ්‍රී ලංකාව පැමිණි චීන ජාතික කාන්තාව හමුවීමට දිනයකට පෙර එනම් 2020 ජනවාරි 26 දින කොවිඩ්-19 වසංගතය මැඩලීමේ "**ජාතික ක්‍රියාකාරී කමිටුව**" (National Action Committee) පිහිටුවන ලදී. ජාතික බෝවන රෝග විද්‍යායතනයේදී ඉහත ආසාදිත කාන්තාවට ප්‍රතිකාර කරන ලද අතර ඇය පූර්ණ සුවය ලබා 2020 පෙබරවාරි 19 දින තම රට බලා පිටව යන ලදී. ශ්‍රී ලංකා රජයට කොවිඩ්-19 වෛරසය ව්‍යාප්තිය මැඩලීම සඳහා ඉදිරි ක්‍රමෝපායන් සැකසීමට සහ කඩිනම් සැලසුම් ක්‍රියාත්මක කිරීමට මෙම සිදුවීම ඉවහල් විය.


3. මෙහිදී වෛරසයේ ගෝලීය, කලාපීය හා ශ්‍රී ලංකාව තුළ ව්‍යාප්තිය සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීම හා එහි බලපෑම තක්සේරු කිරීම රාජ්‍ය බුද්ධි සේවාව වෙත පවරන ලද අතර ඕනෑම හදිසි සෞඛ්‍ය තත්ත්වයකට මුහුණ දීමට වෛද්‍ය ක්ෂේත්‍රය සූදානම් කරන ලදී. තවද අනෙකුත් අවශ්‍ය සේවාවන්ද දැනුවත් කර සූදානම් කිරීම මෙන්ම ආරක්ෂක අංශයන්ද මේ සඳහා සූදානම්ව තබමින් නිරෝධායන මධ්‍යස්ථාන ආරම්භ කර පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය බලයද ඔවුන් වෙත ලබාදෙන ලදී. මතුවන මොනයම් හෝ හදිසි අවස්ථාවක් තුළදී රට තුළ නීතිය හා සාමය රැකගැනීමට ශ්‍රී ලංකා පොලිසිය සූදානම් කර තබන ලදී. චීනයේ කොටුවී සිටි ශිෂ්‍ය ශිෂ්‍යාවන් 33 දෙනෙකු ශ්‍රී ලංකාවට රැගෙන ඒම, ඔවුන් නිරෝධායනය සහ මුදාහැරීම තුළින් ශ්‍රී ලංකාවේ පෙර සූදානම කොතෙක්ද යන්න තහවුරු වේ.

4. තවද කොවිඩ්-19 වෛරසයේ කේන්ද්‍රස්ථානය චීනයේ සිට බටහිර දෙසට මාරුවීමත් සමග ශ්‍රී ලංකා රජය විසින් බොහෝ පූර්ව ක්‍රියාමාර්ග ගන්නා ලදී. 2020 මාර්තු 10 දින සිට කොවිඩ්-19 වෛරසයේ බලපෑමට ලක් වූ රටවලින් ශ්‍රී ලංකාව තුළට ආගමන වලක්වමින් සංචාරක සීමාවන් පැනවූ අතර 2020 මාර්තු 20 දින සිට ශ්‍රී ලංකාව තුළට වූ සියළු ආගමනයන් නවතා දමන ලදී. මෙම

කාලය තුළ රට තුළට පැමිණි සියළුම අයවලුන් නිරෝධායන මධ්‍යස්ථාන වෙත යොමු කරන ලද අතර 2020 මාර්තු මස 10 දිනට පෙර විදේශයන්හි සිට පැමිණි සියළු පිරිස්ද ස්වයං නිරෝධායනයට ලක්කරවීමට කටයුතු කරන ලදී. හදිසි තත්ත්වයක් සඳහා මුහුණ දීමට වෛද්‍ය හා සෞඛ්‍ය සේවා ක්ෂේත්‍රයන් සූදානම් කරවන ලදී. මෙම ක්‍රියාමාර්ගයන් අතර සෞඛ්‍ය සේවය ශක්තිමත් කිරීම, කොවිඩ්-19 පරීක්ෂණ සඳහා ප්‍රමාණවත් පරීක්ෂණ කට්ටල ගෙන්වා ගැනීම, රෝහල්වල යටිතල පහසුකම් ශක්තිමත් කිරීම හා කොවිඩ් රෝගීන් සඳහා රෝහල් වෙන් කිරීම මෙන්ම ඒ සඳහා නව රෝහල් ඉදිකිරීමද සිදුකරන ලදී. තවද රජය විසින් කොවිඩ්-19 ආශ්‍රිත සියළු සැලසුම් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් **“කොවිඩ්-19 ව්‍යාප්තිය වැළැක්වීමේ ජාතික මෙහෙයුම් මධ්‍යස්ථානය”** (National Operation Centre for Prevention of COVID-19 Outbreak / NOCPCO) ස්ථාපිත කරන ලදී. මෙම මධ්‍යස්ථානය අතිගරු ජනාධිපතිතුමාගේ දැක්ම සාක්ෂාත් කරගැනීමට මහගු දායකත්වයක් දක්වනු ලබයි.

## කොවිඩ්-19 වෛරස ව්‍යාප්තිය මැඩලීමේ ශ්‍රී ලාංකීය ක්‍රමවේදය

5. කොවිඩ්-19 වෛරසය ව්‍යාප්තියට එරෙහිව සටන් කිරීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් ගන්නා ලද උපාය මාර්ගය සමස්ත රාජ්‍ය අංශයේ සාමූහික ප්‍රවේශයක් ලෙස දැක්විය හැක. එය අතිගරු ජනාධිපතිතුමාගේ දැක්ම අරමුණු කරගනිමින් සියළු මට්ටම් දක්වා විහිදුනු අඛන්ඩ ක්‍රියාකාරකම් සමූහයක් ලෙස හැදින්විය හැක. ශ්‍රී ලාංකීය ක්‍රමවේදය පුළුල් ලෙස මෙහෙයුම් ස්ථර හතරක් වෙත අවධානය යොමු කර ඇත. එම මෙහෙයුම් ස්ථරයන් පහත ලෙස සංකල්පගත කළ හැක:




රූප සටහන 1 : සමස්ත රාජ්‍ය අංශයේ සාමූහික ප්‍රවේශයේ සංකල්පීයකරණය

6. ආකෘතියේ ඇති සෑම මෙහෙයුම් ස්ථරයක්ම ඒවාට අනන්‍යවූ කාර්යභාරයක් ඉටුකරනවා සේම එකිනෙක සමග අන්‍යෝන්‍යව සම්බන්ධ වේ. එම මෙහෙයුම් ස්ථරවල කාර්යභාරයන් පහත පරිදි වේ:

අ. **<u>සන්නද්ධ හමුදා / පොලිස් / බුද්ධි අංශ මෙහෙයුම් ස්ථරය</u>**. මෙම මෙහෙයුම් ස්ථරය ශ්‍රී ලංකාව තුළට වෛරසය පැමිණීම වැළැක්වීම හා දැනටමත් වෛරසය රට තුළ සක්‍රිය නම් එය තවදුරටත් පැතිරීම වැළැක්වීම අරමුණු කොට ක්‍රියාත්මක වේ. සන්නද්ධ හමුදා / පොලිස් / බුද්ධි අංශ මෙහෙයුම් ස්ථරයේ ක්‍රියාකාරීත්වය මගින් වසංගත තත්ත්වය වෛද්‍ය සහ සෞඛ්‍ය ආරක්ෂණ මෙහෙයුම් ස්ථරය විසින් පහසුවෙන් හැසිරවිය හැකි හා කළමනාකරණය කළ හැකි වන තත්ත්වයට පත්කරනු ලබයි. රාජ්‍ය බුද්ධි සේවාව විසින් ආසාදිතයින් හා සම්බන්ධවූවන් සෙවීමේ මෙහෙයුම්ද සන්නද්ධ හමුදා විසින් එසේ හඳුනා ගත් අයවලුන් හුදකලා කිරීමද ශ්‍රී ලංකා පොලීසිය විසින් රෝග ව්‍යාප්තිය අවම කිරීම සඳහා සංචරණ සීමා පාලනය කිරීමද කරනු ලබයි. මෙම ස්ථරයෙහි සියළු අංශ සම්බන්ධීකරණය වෙනුවෙන් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය ප්‍රධාන කාර්යභාරයක් ඉටුකරනු ලබයි.

ආ. **<u>වෛද්‍ය සහ සෞඛ්‍ය ආරක්ෂණ මෙහෙයුම් ස්ථරය</u>**. වෛද්‍ය හා සෞඛ්‍ය සේවා මෙහෙයුම් ස්ථරය මගින් මූලිකව මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් හරහා වෛරස් ආසාදිතයින්ව හා ඔවුන් සම්බන්ධතා පැවැත්වූවන් කල්තියා හඳුනා ගැනීම, හුදකලා කිරීම සහ ප්‍රතිකාර ලබාදීම සිදුකරනු ලබයි. තවද මෙම මෙහෙයුම් ස්ථරය මගින් රෝග පැතිරීම වැළැක්වීම සඳහා මහජන සෞඛ්‍ය ආරක්ෂක පියවරයන් ප්‍රවර්ධනය කිරීම සහ ආසාදිතයින්ට නිරාවරණය වූ පුද්ගලයින් නිරෝධායනයට ලක්කිරීම යන ක්‍රියාකාරකම්ද සිදු කරයි. ආසාදිතයින් හඳුනාගැනීම සඳහා අවශ්‍ය පරීක්ෂණ රටපුරා විහිදුණු රසායනාගාර ජාලයක් මගින් සිදු කරනු ලැබේ. මේ සඳහා වසංගත රෝග විද්‍යා ඒකකය හා බැදුනු බිම් මට්ටමේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ ක්‍රියාකාරීත්වය, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්ගේ දායකත්වය මෙන්ම නිරෝධායනය හා ප්‍රතිකාර ලබාදීම් සඳහා වූ රෝහල් පද්ධතියේ ක්‍රියාකාරීත්වයද ඉතා වැදගත් වේ. සෞඛ්‍ය අමාත්‍යාංශය මෙම ස්ථරය මෙහෙයවීමේ ප්‍රධානත්වය ගෙන කටයුතු කරනු ලබයි.

ඇ. **<u>මනෝවිද්‍යාත්මක මෙහෙයුම් ස්ථරය</u>**. මෙම මෙහෙයුම් ස්ථරය මගින් කොවිඩ්-19 වෛරසය ගෝලීය වශයෙන් හා රට තුළ කෙසේ ව්‍යාප්තව ඇත්ද යන්න පිළිබඳව නිවැරදි තොරතුරු සැපයීම, වෛරසය පැතිරීම වැළැක්වීම, පාලනය කිරීම සහ ව්‍යාප්තිය අවම කිරීම සඳහා රජය විසින් ගනු ලබන ක්‍රියා මාර්ග, වෛද්‍ය හා සෞඛ්‍ය ආරක්ෂණ උපදෙස්, නීතිය හා සාමය සම්බන්ධ උපදෙස් හා නීති පිළිපැදීමට ජනතාව දිරිමත් කිරීම කරනු ලබන අතර ජාතික සහයෝගීතාවය තහවුරු කිරීමටද ක්‍රියා කරනු ලබයි. මනෝවිද්‍යාත්මක මෙහෙයුම් ස්ථරය සියළු ජාතීන් හා ආගම්වලට අදාළ වූ ජනතාවගේ අවශ්‍යතා අරමුණු කරගනිමින් ක්‍රියාකරනු ලබයි.

ඈ. **<u>ආර්ථික හා සමාජීය යහ පැවැත්ම උදෙසා වන මෙහෙයුම් ස්ථරය</u>**. රටේ අනාගතය කෙරෙහි අවධානය යොමුකරමින් ආර්ථිකය පවත්වා ගැනීම සහ ජනතාවට අඛණ්ඩව ආහාර හා ඖෂධ සැපයුම් ලබාදීමෙන් ඔවුන්ගේ ජීවන තත්ත්වය පවත්වාගෙන යාම පිළිබඳව මෙම ස්ථරය අවධානය යොමු කරයි. එමෙන්ම මෙම ස්ථරය වසංගත තත්ත්වය හමුවේ රටේ අත්‍යාවශ්‍ය සේවා හා පරිපාලන කටයුතු ක්‍රියාත්මක කිරීම කෙරෙහි ද අවධානය යොමු කෙරේ. තවද වසංගත තත්ත්වය හේතුවෙන් අනාගත ගෝලීය ආර්ථික අවපාතයට එරෙහිව ශ්‍රී ලංකාව තුළ මධ්‍ය හා දිගු කාලීන ආර්ථික උපාය මාර්ග සැකසීමද මෙම මෙහෙයුම් ස්ථරයේ වගකීම වේ.

**<u>සන්නද්ධ හමුදා / පොලිස් / බුද්ධි අංශ මෙහෙයුම් ස්ථරය</u>**

7. සන්නද්ධ හමුදා / පොලිස් / බුද්ධි අංශ මෙහෙයුම් ස්ථරය යනු බුද්ධි අංශ දායකත්වයෙන් ක්‍රියාත්මක වනු ලබන මෙහෙයුම් ස්ථරයකි. වෛරස ව්‍යාප්තියේ මූලාරම්භය හඳුනා ගැනීම, අවදානමට ලක්විය හැකි ප්‍රජාවන් හඳුනා ගැනීම, ආසාදනය වීමේ සම්භාවිතාවන් අවබෝධ කරගැනීම සහ මිනිස් සංචරණයන් හරහා එය පැතිරීම වැළැක්වීම මෙම මෙහෙයුම් ස්ථරයේ වගකීම වේ. මෙහි මූලික සිද්ධාන්තය වන්නේ හඳුනාගැනීම (Detection), හුදකලා කිරීම (Isolation) සහ සම්බන්ධිතයන් සොයාගැනීම (Tracing) වන අතර එය DIT ආකෘතිය ලෙස හැඳින්වේ. මෙම ආකෘතියේ සෑම අංගයක්ම එකිනෙක සමග බැඳී ඇති අතරම එකිනෙක සමග අන්‍යෝන්‍යව සම්බන්ධද වේ. මෙහි ක්‍රියාකාරීත්වය පහත පරිදි වේ:


අ. **<u>හඳුනාගැනීම</u>**. හඳුනාගැනීම දෙයාකාර වන අතර ආසාදිතයන් හඳුනා ගැනීම සහ ආසාදනයට ලක්විය හැකි අවදානම් කණ්ඩායම් හඳුනා ගැනීම එම දෙයාකාරය වේ. තහවුරුවූ ආසාදිතයින් හඳුනා ගැනීම වෛද්‍ය සහ සෞඛ්‍ය ක්‍රියාවලියකි. මෙම ස්ථරය යටතේ හඳුනා ගැනීම යනු වෛරසය බහුල ව්‍යාප්තියක් ඇති රටකින් ශ්‍රී ලංකාවට පැමිණි පුද්ගලයින් හෝ වෙනත් යම් ආකාරයකින් වෛරසයේ ආසාදනයට පහසුවෙන් ගොදුරු විය හැකි අවදානම් පුද්ගලයන් / ප්‍රජාව හඳුනා ගැනීම වේ. ඒ සඳහා මූලික වශයෙන් භූමි / තාක්ෂණික දත්ත විශ්ලේෂණය, ආගමන විගමන දත්ත, පුද්ගලයින් ලියාපදිංචි කිරීම සම්බන්ධ තොරතුරු, ඡන්ද හිමි නාම ලේඛන දත්තයන් වැනි විවිධ ආයතනයන්හි දත්ත විශ්ලේෂණය සඳහා යොදා ගැනේ.

ආ. **<u>හුදකලා කිරීම</u>**. ඉහත පරිදි අවදානම් ප්‍රජාව හඳුනාගැනීම සිදු කළ පසු එම ප්‍රජාව වෙන් කිරීම වෙනුවෙන් විවිධ ක්‍රියාකාරකම් කරනු ලබයි. මෙහිදී එක් එක් ප්‍රජාවන් වෙන් වෙන්ව ස්වයං නිරෝධායනය කිරීම, නිරෝධායන මධ්‍යස්ථාන වෙත යොමුකිරීම, ඇඳිරි නීතිය පැනවීම මගින් සංචරණයන් පාලනය කිරීම තුළින් වෛරස ව්‍යාප්තිය අවම කිරීම, අවදානම් ප්‍රදේශ වෙන්කිරීම සහ අවශ්‍ය වුවහොත් පූර්ණ අගුළු දැමීමකට ලක්කිරීම කරනු ලැබේ. මෙම කර්තව්‍යයේදී ශ්‍රී ලංකාවේ සන්නද්ධ අංශ, විශේෂයෙන් ශ්‍රී ලංකා යුද හමුදාව නිරෝධායන මධ්‍යස්ථාන ස්ථාපනය කිරීම, පුද්ගලයින් නිරෝධායන මධ්‍යස්ථාන වෙත යොමු කිරීම, නිරෝධායන මධ්‍යස්ථාන පවත්වාගෙන යාම හා නිරෝධායනය වන පුද්ගලයින්ට ආහාර පාන හා වෛද්‍ය පහසුකම් සැපයීම ඇතුළු සුභසාධනය සැලසීම සඳහා සුවිසල් වගකීමක් ඉටුකරනු ලබයි. මේ අතර ශ්‍රී ලංකා පොලීසිය විසින් අවශ්‍ය අවස්ථාවන්හිදී ගම්මාන පූර්ණ අගුලු දැමීමට ලක් කිරීම, ඇඳිරි නීතිය ක්‍රියාත්මක කිරීම ඇතුළු රට තුළ නීතිය හා සාමය ස්ථාපිත කිරීමට අවශ්‍ය පූර්ණ දායකත්වය සපයනු ලබයි.

ඇ. **<u>සම්බන්ධිතයින් සොයාගැනීම</u>**. කොවිඩ්-19 වෛරසය ව්‍යාප්තියේ මූලාරම්භය සොයාගැනිමට සහ පැතිරීම වැළැක්වීමට ඉතාම වැදගත් මෙම ක්‍රියාවලිය භූමි තොරතුරු විශ්ලේෂණය හා තාක්ෂණික දත්ත විශ්ලේෂණය මත පදනම් වේ. මෙහිදී දුරකථන දත්ත විශ්ලේශණයන් සුවිශේෂී වැදගත්කමක් ගනී. මෙමගින් ආසාදිතයින්ගේ පවුලේ සාමාජිකයින්, සමීප ඇසුරු කරන්නන්, දුරස්ථ ඇසුරුකරන්නන්, ආසාදිතයා ආ ගිය ස්ථාන, සංචරණ රටාවන් අධ්‍යනය කෙරේ. එමගින් හඳුනාගනු ලබන පුද්ගලයින් ඒ වනවිටත් ආසාදනය වී ඇති ද යන්න හා ආසාදනය වීමට ගොදුරුවිය හැකිද යන්න පිළිඳව අනාවරණය කරගනු ලබයි. මෙම ක්‍රියාවේ ප්‍රතිඵලයක් ලෙස එලෙස හඳුනාගනු ලබන පුද්ගලයින් හෝ ප්‍රජාවන් ස්වයං නිරෝධායනයට ලක් කිරීම හෝ නිරෝධායන මධ්‍යස්ථාන වෙත යොමු කිරීම සිදු කරනු

ලබයි. මෙම ක්‍රියාවලියේදී රාජ්‍ය බුද්ධි සේවාව, යුද හමුදා බුද්ධි අධ්‍යක්ෂ මණ්ඩලය, නාවික හමුදා බුද්ධි අංශය සහ පොලිස් විශේෂ කාර්යාංශය ප්‍රමුඛත්වය ගෙන ක්‍රියා කරයි.


8. ආසාදිතයින් සොයාගැනීමේ සංකල්පය පහත ආකාරයෙන් විදහා දැක්විය හැක:




රූප සටහන 2 : හඳුනාගැනීමේ, හුදකලාකිරීමේ සහ සම්බන්ධිතයින් සොයාගැනීමේ DIT ආකෘතිය

9. DIT ආකෘතිය පූර්ව ක්‍රියාකාරී වූද ආක්‍රමණශීලී වූද ක්‍රියාවලියක් වන අතර එය ඉදිරියට හා පසුපසට යන දෙආකාරයෙන්ම ක්‍රියාත්මක වන සංකල්පයක් වේ. නව ආසාදිතයෙකු අනාවරණය වූ විට හෝ වාර්තා වූ විට, වෛරසයේ ආරම්භය සහ පැතිරීමේ රටාව හඳුනාගැනීම සඳහා මෙම ආකෘතිය පසුපසට ක්‍රියා කරයි. මේ සඳහා භූමි සෝදිසි කිරීම් / සත්‍යාපනයන්, වාර්තා පරීක්ෂා කිරීම්, ආගමන විගමන දත්ත, දුරකථන දත්ත විශ්ලේෂණයන්, හෝටල් හා ලැගුම්හල් වෙන්කරවා ගැනීම් පිළිබඳ තොරතුරු අධ්‍යනය සහ මේ සඳහා දායක කරගත හැකි වෙනත් විවිධ ක්‍රමවේදයන්ද යොදාගනු ලබයි. මෙසේ ලබාගන්නා දත්ත අනුසාරයෙන් ඉහත ආකෘතිය ප්‍රකාරව අවදානමට ලක්විය හැකි ප්‍රජාවන් (පවුල් සම්බන්ධිතයන් / Family Associates, සමීප සම්බන්ධිතයන් / Close Associates, දුරස්ථ සම්බන්ධිතයන් / Distance Associates සහ වෙනත් සම්බන්ධතා) හුදකලා කිරීමට, ස්වයං නිරෝධායනයට සහ / හෝ නිරෝධායන මධ්‍යස්ථාන වෙත යොමු කිරීම සඳහා ආකෘතිය ඉදිරියට ක්‍රියා කරනු ලබයි. අවදානමට ලක්විය හැකි ප්‍රජාවන්ගෙන් ඕනෑම අයෙකු ආසාදිතයෙකු වුවහොත් DIT ආකෘතිය එක් එක් සිද්ධියට සමාන ආකාරයෙන් ක්‍රියාකරනු ලබයි. මෙය දුෂ්කර හා අඛණ්ඩ ක්‍රියාවලියක් වුවත් ඉතා ඵලදායී ක්‍රියාවලියක් වන බව ප්‍රත්‍යක්ෂ වී ඇත.

10.  DIT ආකෘතියේ ක්‍රියාකාරීත්වය පහත පරිදි වේ:





රූප සටහන 03 : DIT ආකෘතියේ ක්‍රියාකාරීත්වය

<u>**වෛද්‍ය සහ සෞඛ්‍ය ආරක්ෂණ මෙහෙයුම් ස්ථරය**</u>

11.  <u>**සෞඛ්‍ය ආවේක්ෂණය**</u>. ශ්‍රී ලංකාව තුළ පවතින කොවිඩ්-19 වෛරස පොකුරු සම්ප්‍රේෂණ තත්ත්වය තුළ නිරෝධායන පියවරයන් සඳහා යොමුකරන ලද පුද්ගලයින්ගේ සම්බන්ධතා හරහා ආසාදිතයින් හඳුනාගැනීම, ආසාදිත පුද්ගලයින් ඇසුරුකල අයවලුන් සොයාගැනීම, උග්‍ර ශ්වසන රෝගාබාධයන් ඇති අයවලුන් සොයාගැනීම හා හදිසි මරණ සම්බන්ධයෙන් පශ්චාත් මරණ පරීක්ෂණ මගින් ආසාදිතයින් අනාවරණය කරගැනීම සෞඛ්‍ය ආවේක්ෂණයේදී අවධානයට යොමු වේ. සෞඛ්‍ය අංශය සන්නද්ධ හමුදා, පොලීසිය සහ බුද්ධි අංශ හා එක්ව වෛරසය ප්‍රජා සම්ප්‍රේෂණ මට්ටමට යොමුවීම වැළැක්වීමට දැඩි උත්සාහයක නිරත වේ. එලෙසම ප්‍රජා සම්ප්‍රේෂණ වාර්තා වූ ඇතැම් අවස්ථාවලදී වෛරසයේ භූගෝලීය ව්‍යාප්තිය අධීක්ෂණය කිරීම සඳහා නිරීක්ෂණ පුළුල් කිරීම, සම්ප්‍රේෂණ තීව්‍රතාව, පැතිරයාමේ ප්‍රවණතා, වෛරසයේ විද්‍යාත්මක ලක්ෂණ හඳුනාගැනීම හා වෛරස ව්‍යාප්තිය මගින් සෞඛ්‍ය සේවා සඳහා වන බලපෑම් තක්සේරු කිරීමද මෙමගින් සිදුකරනු ලබයි.

12.  <u>**ආසාදිතයින් හඳුනාගැනීම**</u>. වෛරසය ආසාදිතයින් හඳුනාගැනීම සිව් ආකාරයෙන් ක්‍රියාත්මක කරනු ලබන අතර එයට (අ) රෝහල්වලට ඇතුළත් කර ඇති ආසාදිත බවට සැක කෙරෙන පුද්ගලයින් සම්බන්ධ රසායනාගාර පරීක්ෂණ මගින් තහවුරු කර ගැනීම (ආ) වෛරසය ආසාදිතයින් ඇසුරු කර ඇති අයවළුන් පරීක්ෂාවට ලක්කිරීම (ස්වයං නිරෝධායනයට හෝ නිරෝධායන මධ්‍යස්ථානවල සිටිනු ලබන) (ඇ) අධි අවදානම් කලාප / එහි සිටින පුද්ගලයින් අහඹු ලෙස පරීක්ෂාවට ලක්කිරීම සහ (ඇ) දේශ සීමා පාලන ස්ථානයන්හිදී පරීක්ෂාවට ලක්කිරීම ඇතුලත් වේ. PCR පරීක්ෂණ කරනු ලබන ආකාරය පිළිබඳව වසංගත රෝග විද්‍යා ඒකකය විසින් මේ වන විටත් සැලසුම් ක්‍රියාත්මක කර ඇති අතර සරලව ආසාදිතයින් හඳුනාගැනීමේ ක්‍රියාවලිය පහත දැක්වේ:





රූප සටහන 4 : වෛරසය ආසාදිතයින් හඳුනා ගැනීම

13. සමස්ත සෞඛ්‍ය ආවේක්ෂණය වසංගත රෝග විද්‍යා ඒකකය විසින් සම්බන්ධීකරණය කරනු ලැබේ. සැක සහිත ආසාදිතයෙකු හමු වූ විට හෝ රසායනාගාර වාර්තාවකින් යමෙකු වෛරසය ආසාදිත බව තහවුරුවූ විට රෝහල හෝ රසායනාගාරය විසින් අදාළ ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා, ප්‍රාදේශීය වසංගත රෝග විද්‍යාඥයා මෙන්ම ජාතික වසංගත රෝග විද්‍යා ඒකකය ඒ පිළිබඳව දැනුවත් කරනු ලබයි. අනතුරුව දිවයින පුරා ක්‍රියාත්මක වන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් 345 දෙනෙකුගේ ජාලය හරහා සන්නද්ධ හමුදා, පොලීසිය හා බුද්ධි අංශ සහයෝගය ඇතිව සෞඛ්‍ය ආවේක්ෂණය සිදුකරනු ලබයි. මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්ගෙන් සමන්විත ප්‍රාථමික සෞඛ්‍යාරක්ෂණ කණ්ඩායම් විසින් දින 14ක ආසාදිතයින්ගේ සම්බන්ධතා ඉතිහාසය මත පදනම්ව ආසාදිත පුද්ගලයාට නිරාවරණය වූ සියළුම පුද්ගලයින් පරීක්ෂාවට භාජනය කරනු ලබයි. පසුව එසේ සොයාගන්නා ලද පුද්ගලයින් ස්වයං නිරෝධායනයට හෝ නිරෝධායන මධ්‍යස්ථාන වෙත යොමුකිරීම කරනු ලබයි.

14. **<u>සෞඛ්‍ය නියාමනය.</u>** ආසාදිතයින්ට නිරාවරණය වූ පුද්ගලයින් දින 14ක් අධීක්ෂණය කරනු ලබන අතර රෝග ලක්ෂණ පෙන්නුම් කරයි නම් ඔවුන් පරීක්ෂණ සඳහා විශේෂ නිරෝධායන රෝහල්වලට ඇතුළත් කරනු ලැබේ. එසේම රෝග ලක්ෂණ නොමැති අයවලුන්ද වෛද්‍ය පරීක්ෂණවලින් පසුව පමණක් නිරෝධායනයෙන් නිදහස් කරනු ලබයි. ආසාදිත හා නිරෝධායනය වුවන් පිළිබඳ තොරතුරු විශේෂ විමර්ශන පෝරමයක් මගින් කළාපීය මට්ටමින් දිස්ත්‍රික් වසංගත රෝග විද්‍යාඥයා සහ ප්‍රාදේශීය සෞඛ්‍ය අධ්‍යක්ෂවරයා වෙතද ජාතික මට්ටමින් වසංගත රෝග විද්‍යා ඒකකය වෙතද යොමුකරනු ලබයි. වසංගත රෝග විද්‍යා ඒකකය විසින් දත්ත එක්රැස් කිරීමට අමතරව අහඹු ලෙස අදාළ ප්‍රදේශවල සංචාරය කරමින් නිරෝධායනය හා විමර්ශනයන් ලෝක සෞඛ්‍ය සංවිධානයේ (WHO) මාර්ගෝපදේශයන්ට අනුකූලව සිදුවන්නේද යන්න සොයාබැලීම සිදු කරයි.

මනෝවිද්‍යාත්මක මෙහෙයුම් ස්ථරය

15. කොවිඩ්-19 වසංගතය දුරු කිරීමෙහිලා ක්‍රියාත්මක වන මනෝවිද්‍යාත්මක මෙහෙයුම් ස්ථරයේ මූලික හරය වන්නේ “**පළමුව ජීවිතය**” යන්නයි. කොවිඩ්-19 වසංගතයේ සත්‍ය තොරතුරු ශ්‍රී ලාංකික ජනතාවට මෙන්ම ජාත්‍යන්තර ප්‍රජාවටද ලබාදීම ඉතා වැදගත් වේ. ඒ මගින් තහවුරු නොකළ ප්‍රභවයන් විසින් ප්‍රචාරය කරනු ලබන සාවද්‍ය තොරතුරු මෙන්ම මහජනතාව මුලාවට පත්වන තොරතුරු සමාජගතවීම වළක්වාලනු ලබයි. ශ්‍රී ලංකා රජය විසින් ආරම්භ කරනු ලබන හෝ ක්‍රියාවට නංවනු ලබන පියවරයන් සම්බන්ධයෙන් නිල තොරතුරු ප්‍රචාරක ඒකකය ලෙස “**ජනාධිපති මාධ්‍ය ඒකකය**” (President’s Media Division / PMD) ක්‍රියා කරනු ලබයි. මෙම මාධ්‍ය ඒකකය විසින් නිල තොරතුරු එහි නිල වෙබ් අඩවිය, ට්විටර් ගිණුම හා මුහුණු පොත ඔස්සේ ප්‍රචාරණය කරනු ලබයි. මනෝවිද්‍යාත්මක මෙහෙයුම් ස්ථරයේ සංකල්පය පහත ආකෘතිය අනුව වේ:




රූප සටහන 5 : මනෝවිද්‍යාත්මක මෙහෙයුම් ස්ථරයේ සංකල්පීයකරණය

16. **කොවිඩ්-19 ව්‍යාප්තිය වැළැක්වීමේ ජාතික මෙහෙයුම් මධ්‍යස්ථානය** විසින් ජනමාධ්‍ය හරහා මහජනතාව වෙත තොරතුරු ලබාදීම, මාධ්‍ය සමාලෝචන පැවැත්වීම, සංඛ්‍යා ලේඛන හා මෙහෙයුම් පිළිබඳ විස්තර ඉදිරිපත් කිරීම කරනු ලබයි. තවද සෞඛ්‍ය අමාත්‍යාංශයේ **වසංගත රෝග විද්‍යා අංශය** (Epidemiology Unit) හා **සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශය** (Health Promotion Bureau) ද නිවැරදි තොරතුරු හා සංඛ්‍යා ලේඛන අදාළ වෙබ් අඩවි හරහා නිකුත් කරනු ලබයි. විවිධ අංශයන්හි ප්‍රවීනයන් විසින් රාජ්‍ය, පුද්ගලික මාධ්‍ය ඔස්සේ මෙන්ම සමාජ මාධ්‍ය ජාලා හරහාද විවිධ වැඩසටහන් ඉදිරිපත් කිරීම තුළින්ද නිවැරදි තොරතුරු මහජනතාව වෙත දැනුම්දෙනු ලැබේ. මෙම ආකාරයෙන්ම මේ සඳහා මුද්‍රිත මාධ්‍යද භාවිතා කරනු ලබයි. කොවිඩ්-19 වසංගතය මැඩලීමට හා පාලනය කිරීමට ශ්‍රී ලංකා රජය විසින් ගෙන ඇති මෙවැනි විවිධ පියවරයන් මගින් මහජන විශ්වාසය ඇති කිරීම අරමුණු කෙරේ.

ආර්ථිකය සහ යහපැවැත්ම උදෙසා වන මෙහෙයුම් ස්ථරය

17. කොවිඩ්-19 වසංගත තත්ත්වය හමුවේ ඇති ආර්ථික අභියෝග හා නව අවස්ථාවන් හඳුනා ගනිමින් දිගු කාලීන ආර්ථික අරමුණු වලට අනුකූලව ආර්ථිකය නගාසිටුවීම සහ දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්තීන්ට අනුකූලව ක්‍රියා කිරීමට ජනාධිපති කාර්ය සාධන බලකායක් පිහිටුවා ඇත. නව මූලාරම්භයන් මත පදනම්ව ශ්‍රී ලංකාවට අනන්‍යවූ ආර්ථික ව්‍යුහයක් සැකසීම තුළින් ඵලදායී ආර්ථිකයක් නිර්මාණය කිරීම සඳහා අදාළ ආයතන මෙහෙයවීමේ වගකීම මෙම කාර්ය සාධන බලකායට පැවරී ඇත. දේශීය කර්මාන්තකරුවන් සහ ව්‍යවසායකයින් ප්‍රවර්ධනය කරන ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක් ඇති කිරීම සඳහා ඒකාබද්ධ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමද කාර්ය සාධන බලකාය පිහිටුවීමේ තවත් අරමුණකි.

18. මධ්‍ය හා කෙටි කාලීනව කාර්ය සාධන බලකාය විසින් කොවිඩ්-19 ව්‍යාප්තිය හමුවේ ඉහළ අවදානම් කලාප ලෙස හඳුනාගෙන ඇති ප්‍රදේශවල සිවිල් ජීවිතය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා අත්‍යාවශ්‍ය සේවාවන් සැපයීම කරනු ලබයි. සිවිල් ජනජීවිතවල සාමාන්‍ය තත්ත්වය පවත්වා ගැනීම සඳහා නොයෙකුත් ආයතන විසින් ගනු ලබන ක්‍රියාකාරකම් කෙරෙහි අවධානය යොමු කරමින් හා එම සියළුම ආයතන සමඟ මනා ලෙස සම්බන්ධීකරණය වෙමින් භාණ්ඩ හා සේවා ජනතාව වෙත ලබා කරවීමද මෙම කාර්ය සාධන බලකායේ වගකීමක් වේ. මෙම කාර්ය සාධක බලකාය ආණ්ඩුකාරවරුන්, අමාත්‍යාංශ ලේකම්වරුන්, ත්‍රිවිධ හමුදාපතිවරුන්, වැඩබලන පොලිස්පති, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, සංස්ථා සභාපතිවරුන් සහ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම්වරුන්ගෙන් සමන්විත වේ.

19. කාර්ය සාධන බලකායේ සවිස්තරාත්මක විෂය පථයට සියලුම දිස්ත්‍රික්ක වල ජනතාවට සහල්, එළවළු සහ වෙනත් නිෂ්පාදන බෙදා හැරීම, ගොවීන් සහ දේශීය ආර්ථිකය ශක්තිමත් කිරීම, ගොවිතැන් කටයුතු සහ ගෙවතු වගාව දිරිගැන්වීම සහ සහාය දීම, කාබනික පොහොර භාවිතය ප්‍රවර්ධනය කිරීම, ගොවීන්ට මූලාධාර සැපයීම, සමුපකාර සහ වෙනත් සිල්ලර වෙළෙන්දන් / ව්‍යාපාරික ජාල සංවිධානය කිරීම ආදී කර්තව්‍යයන් ඇතුළත් වේ. මහජනයාට ඖෂධ බෙදා හැරීම සහ බැංකු පහසුකම් ක්‍රියාත්මක කිරීම ද කාර්ය සාධන බලකායට පැවරී ඇති තවත් වගකීමකි.


<u>**ශ්‍රී ලාංකීය ක්‍රමවේදයේ ඒකාබද්ධ ප්‍රවේශය**</u>

20. ශ්‍රී ලංකීය ක්‍රමවේදයේ සියළුම මෙහෙයුම් ස්ථරයන් හුදකලාව ක්‍රියා නොකරන අතර හුදකලාව ක්‍රියාකිරීම මගින් මෙම උවදුරට සාර්ථකව මුහුණදී අපේක්ෂිත ප්‍රතිඵල ළඟාකරගත නොහැක. ආසාදිතයින් සොයාගැනීමට හා හුදකලා කිරීමට මෙන්ම සම්බන්ධිතයින් සොයාගැනීම සඳහා සන්නද්ධ සේවා, පොලිස් හා බුද්ධි අංශයන්ගේ සහයෝගය සෞඛ්‍ය අංශ වෙත ලබාදිය යුතුය. අනෙකුත් මෙහෙයුම් ස්ථරයන් නිසියාකාරව ක්‍රියාත්මක වීම සඳහාද බුද්ධි තොරතුරු ලබාදීම අත්‍යාවශ්‍ය වේ. ඒ අනුව මෙම සියළු මෙහෙයුම් ස්ථරයන් අතර සම්බන්ධීකරණය හා සහයෝගිතාවය මෙන්ම බිම් මට්ටමේ භූමි හා තාක්ෂණික තොරතුරු සම්බන්ධීකරණයද මෙහිදී අත්‍යාවශ්‍ය වේ. රේඛීය අමාත්‍යාංශයන් අතර සම්බන්ධීකරණය හා සහයෝගීතාවය, ත්‍රිවිධ හමුදාව සහ පොලිසිය, දෙපාර්තමේන්තු, අධිකාරීන්, සංස්ථා බලධාරීන්, පළාත් පාලන පද්ධති, සියලුම රාජ්‍ය හා පෞද්ගලික අංශවල හවුල්කරුවන්ගේ සක්‍රිය දායකත්වය මේ සඳහා අතිශයින් වැදගත් වේ. කොවිඩ්-19 උවදුර පරාජය කිරීමෙහිලා ශ්‍රී ලාංකීය ක්‍රමවේදයේ සාර්ථකත්වයේ පදනම වන්නේ මෙම ඒකාබද්ධ ප්‍රවේශය තුළයි.

<u>**කොවිඩ්-19 හි පැතිරීම පාලනය කිරීමේ ක්‍රමවේදය**</u>

21. කොවිඩ්-19 පැතිරීම පාලනය කිරීම සඳහා 2020 මාර්තු 11 දින සිට මේ දක්වා ශ්‍රී ලංකා රජය විසින් අනුගමනය කරන ලද ක්‍රියාවලිය **"තෝමස් පුයෝගේ"** (Tomas Pueyo) **"මිටිය සහ නර්තනය"** (Hammer and Dance) න්‍යායට සමාන වේ. ආසාදිතයින්ගේ සංඛ්‍යාව ක්‍රමයෙන් වැඩි වන අවස්ථාවලදී ශ්‍රී ලංකා රජය විසින් ආක්‍රමණශීලී වූද ක්‍රියාකාරී වූද විවිධ පියවර (Hammer) අනුගමනය කරමින් වෛරසය පැතිරීමේ ප්‍රවනතාවය පාලනය කරනු ලබයි. මෙමගින් වෛරස ව්‍යාප්තියේ අපේක්ෂිත ගමන් මග වෙනස් කොට සෞඛ්‍ය අංශයන්ට ආයාසයකින් තොරව එය පාලනය කළ හැකි රිද්මයකට තල්ලු කරනු ලබයි (Dance). මෙම ක්‍රමවේදය නොකඩවා ක්‍රියාත්මක අතර එක් අසාදිතයෙකු හෝ ආසාදිතයින්ගේ පොකුරුක් වෙනුවෙන් ක්‍රියාකළ ආකාරය සමාලෝචනය කර එමගින් ලබාගන්නා පළපුරුද්ද ඉදිරි ආසාදිතයින් හා පොකුරු සඳහා ක්‍රියාකිරීම වෙනුවෙන් යොදාගනු ලබයි.

22. පහත ප්‍රස්තාරය 2020 මාර්තු 11 දින සිට 2020 මැයි 3 දින දක්වා ලංකාව තුළ ආසාදිතයින්ගේ වාර්තා වීම පිළිඹිබු කරන අතර සෑම වැඩි වීමක්ම පොකුරු ආසාදනයකට සම්බන්ධ වේ:





රූප සටහන 6 : ශ්‍රී ලංකාව තුල කෝවිඩ් ආසාදිතයින් පොකුරු වාර්තා වීම

<u>පොකුරු ආසාදිතයින් සහ "මිටිය හා නර්තනය" න්‍යාය යොදාගැනීම</u>

23. මේ වනවිට වාර්තාවී ඇති ආසාදිතයින්ගේ පොකුරු සංඛ්‍යාව 31ක් පමණ වේ. විදේශයන්හි සිට පැමිණි ආසාදිතයිගේ පොකුර, දේශීය සංචාරක මග පෙන්වන්නන්ගේ පොකුර, මැණික් ව්‍යාපාරිකයන්ගේ පොකුර, ආගමික කටයුතු සඳහා විදේශගත වූවන්ගේ පොකුර, සීදුව හා ජා ඇල යන ප්‍රදේශයන්හි මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවූවන්ගේ පොකුර, කොළඹ 12 බණ්ඩාරනායක මාවත පොකුර හා නාවික හමුදාවේ වැලිසර මහසෙන් කඳවුරට අදාළ පොකුර යනු මින් කිහිපයක් වේ. මෙකී එක් එක් පොකුරු ආසාදනයන් පාලනය සඳහා **"මිටිය හා නර්තනය"** න්‍යාය අදාළ කරගෙන ඇත. ආසාදිතයින් වැඩිවන සෑම අවස්ථාවකදීම ආක්‍රමණශීලී පියවරයන් අනුගමනය කිරීම හෙවත් මිටිය භාවිතයෙන් කරන ලද ක්‍රියාකාරකම් හේතුවෙන් වසංගත තත්ත්වය පාලනය කළ හැකි වන රිද්මයකට අනුව නර්තන වීමට යොමු කරවන ලදී. මෙම න්‍යාය අදාළ කරගැනීම බොහෝ අවස්ථාවල සාර්ථක ප්‍රතිඵල පෙන්වාදී ඇති අතර කොළඹ 12, බණ්ඩාරනායක මාවත හා වැලිසර මහසෙන් නාවික කඳවුරේ ආසාදිත පොකුරු පාලනය නිදසුන් ලෙස දැක්විය හැකිය.

__බණ්ඩාරනායක මාවත පොකුර__


24. 2020 අප්‍රේල් 15 දින “**බණ්ඩාරනායක මාවත**” හි පළමු රෝගියා වාර්තා වූ අතර 2020 අප්‍රේල් 16 දින තවත් රෝගීන් තිදෙනෙකු එම ප්‍රදේශයෙන් වාර්තා වූ වහාම එම ප්‍රදේශය හුදකලා කිරීම සහ අගුලු දැමීම ආරම්භ විය. ඊට පසු දිනයේදී එනම් 2020 අප්‍රේල් 17 දින “**බණ්ඩාරනායක මාවත**” හි ජනාකීර්ණ ප්‍රදේශවල ජීවත් වූ ජනතාව කොළඹින් පිටත නිරෝධායන මධ්‍යස්ථාන වෙත යොමු කරන ලදී. මෙම පියවර හේතුවෙන් **“බණ්ඩාරනායක මාවත”** ප්‍රදේශයේ හා ඉන් පිටත ආසාදිතයින්ගේ සංඛ්‍යාව සීග්‍ර ලෙස වර්ධනය වීම වළක්වාගත හැකි විය. ඉන් අනතුරුව වාර්තාවූ බොහෝමයක් ආසාදිතයින් නිරෝධායන මධ්‍යස්ථාන තුළින් හමුවූ අතර සමාජයෙන් හමුවූ ආසාදිතයින්ගේ සංඛ්‍යාව අවම අගයක් ගන්නා ලදී:




රූප සටහන 7 : බණ්ඩාරනායක මාවත පොකුර පාලනය

__වැලිසර මහසෙන් නාවික හමුදා කඳවුරු පොකුර__

25. ඉහත පරිදිම වැලිසර “**මහසෙන් නාවික හමුදා කඳවුර**” ආසාදිතයින්ගේ පොකුර සඳහාද ක්‍රියාත්මක වීම හේතුවෙන් වෛරසයේ ක්ෂණික පැතිරීම කඩිනමින් වළක්වා ගතහැකි විය. මෙම කඳවුරෙන් පිටත පළමු ආසාදිත නාවිකයා වාර්තා වන ලද්දේ 2020 අප්‍රේල් 22 දින වන අතර දෙවන ආසාදිත නාවිකයා 2020 අප්‍රේල් 23 දින වාර්තා විය. කඩිනමින්, ආක්‍රමණශීලීව ක්‍රියාකොට නිවාඩු ලබා සිටි සියළු නාවිකයන් නැවත කඳවුරට කැඳවා එකී සියළු නාවිකයින්ගේ පවුල්වල සාමාජිකයින් සහ සමීප ඇසුරක් පැවැත්වූ පුද්ගලයින් නිරෝධායන මධ්‍යස්ථාන වෙත යොමුකිරීම හා අවදානමට ලක්වූ අනෙකුත් අයවළුන්ද ස්වයං නිරෝධායනට යොමු කිරීම මගින් වෛරසය සමාජ සම්ප්‍රේෂණයට තිබූ අවස්ථාව අහුරන ලදී. එතැන් සිට නාවික හමුදා කඳවුරෙන් පිටත සමාජයෙන් වාර්තා වූ ආසාදිතයින් සංඛ්‍යාව ශුන්‍ය විය:




රූප සටහන 8 : වැලිසර මහසෙන් නාවික හමුදා කඳවුරු පොකුර පාලනය

**<u>සමාප්තිය</u>**

26. කොවිඩ්-19 වසංගතය ලොවපුරා පැතිරීම අඛණ්ඩව සිදුවන අතර විවිධ රටවල් වෛරසය පැතිරීම වැළැක්වීම සඳහා විවිධ ක්‍රම සහ විධි භාවිතා කර ඇත. මෙම වෛරසය සම්බන්ධයෙන් බොහෝ පර්යේෂණ හා විද්‍යාත්මක අධ්‍යයනයන් සිදු කර ඇතත් මේ දක්වා විශ්වසනීය එන්නතක් නිපදවා නොමැත. මෙවැනි තත්ත්වයකදී වෛරසය ආසාදනයවීම වැළැක්වීම සහ වෛරසය පැතිරීම පාලනය කිරීම හොඳම විකල්පය ලෙස සැලකේ. කොවිඩ්-19 වසංගතය වැළැක්වීමේ ශ්‍රී ලාංකීය ක්‍රමවේදය සමස්ත රාජ්‍ය යාන්ත්‍රණයේ සාමූහික ප්‍රවේශයක් වන අතර එය වැළැක්වීම, පැතිරයාම පාලනය කිරීම සහ කළමනාකරණය යන පියවරයන්ගෙන් සමන්විත ක්‍රියාදාමයකි. මෙය ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපතිතුමාගේ දැක්ම වන **"ශ්‍රී ලංකාව තුළ කොවිඩ්-19 ව්‍යාප්තිය වැළැක්වීම සඳහා ක්‍රියාකාරී මැදිහත්වීම - PROACTIVE INTERVENTION TO PREVENT ANY OUTBREAK OF COVID-19 WITHIN SRI LANKA"** අනුව ක්‍රියාත්මක වේ. කොවිඩ්-19 ව්‍යාප්තිය තුරන් කිරීමේ ශ්‍රී ලාංකීය ක්‍රමවේදය සක්‍රීය, ආක්‍රමණශීලී සහ නොකඩවා ඉදිරියට යන ක්‍රියාදාමයක් වන අතර ලෝකයේ බොහෝ රටවල් හා සැසඳීමේදී මෙම ක්‍රමවේදය ශ්‍රී ලංකාවටම ආවේණිකවූ ප්‍රශස්ත ආකෘතියක් බව පෙනීයයි.